# ශ්‍රී ලංකා
# ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ
# පාර්ලිමේන්තුව

---

## ඉඩම් සංවර්ධන (සංශෝධන)

**(464 වන අධිකාරය වූ) ඉඩම් සංවර්ධන ආඥාපනත සංශෝධනය කිරීම සඳහා වූ පනත් කෙටුම්පතකි**

---

ඉඩම් අමාත්‍යතුමා විසින් 2022 ජනවාරි මස 21 වන දින ඉදිරිපත් කරන ලදී

(ගැසට් පත්‍රයේ පළ කළේ 2021 දෙසැම්බර් මස 27 වන දින)

මුද්‍රණය කිරීමට පාර්ලිමේන්තුව විසින් නියෝග කරන ලදී

---

[103 වන පනත් කෙටුම්පත]

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.
කොළඹ 5, රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිලදී ලබාගත හැකිය.

**මිල : රු. 18.00** **තැපැල් ගාස්තුව : රු. 15.00**

මෙම පනත් කෙටුම්පත www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.

**නීතිය බලපෑමේ ප්‍රකාශය**

*2 වන වගන්තිය :* "ඉඩම් කොමසාරිස්" යන වචන යෙදෙන කවර හෝ තැනක දී ඒ වචන වෙනුවට "ඉඩම් කොමසාරිස් ජනරාල්" යන වචන ආදේශ කිරීම මගින්, (මෙහි මින් මතු "ප්‍රධාන ප්‍රඥප්තිය" යනුවෙන් සඳහන් කරනු ලබන) (464 වන අධිකාරය වූ) ඉඩම් සංවර්ධන ආඥාපනත සංශෝධනය කරනු ලැබේ.

*3 වන වගන්තිය :* මෙම වගන්තිය මගින් මේ ආඥාපනතේ කාර්යයන් සඳහා, අතිරේක ඉඩම් කොමසාරිස්වරු, නියෝජ්‍ය ඉඩම් කොමසාරිස්වරු, සහකාර ඉඩම් කොමසාරිස්වරු සහ වෙනත් නිලධරයන් සංඛ්‍යාවක් පත් කිරීම සඳහා විධිවිධාන සැලසීම මගින් ප්‍රධාන ප්‍රඥප්තියේ 5 වන වගන්තිය සංශෝධනය කරනු ලැබේ.

*4 වන වගන්තිය :* මෙම වගන්තිය මගින් ප්‍රාදේශීය ලේකම්වරයාගේ අනුමතයකින් තොරව, ඉඩම් කොටසේ අයිතිකරුට ඉඩම් කොටස උකස් කිරීමට හැකියාව ඇති කරවීම සඳහා ප්‍රධාන ප්‍රඥප්තියේ 19 වන වගන්තිය සංශෝධනය කරනු ලැබේ.

*5 වන වගන්තිය :* මෙම වගන්තිය මගින් ප්‍රධාන ප්‍රඥප්තියට 28 වන අලුත් වගන්තිය ඇතුළත් කරනු ලැබේ. අලුත් වගන්තිය මගින්, මනිනු නොලැබූ ඉඩම් සඳහා ප්‍රදාන පත්‍ර නිකුත් කිරීම තහනම් කරනු ලැබේ.

*6 වන වගන්තිය :* මෙම වගන්තිය මගින්, දීමනා පත්‍රයක් පිට අන්සතු කරන ලද ඉඩමක් මිනුම්පති විසින් සම්පාදනය කරන ලද රේඛා සටහනක් ආශ්‍රයෙන් විස්තර කළ යුතු බවට විධිවිධාන සැකසීම මගින් ප්‍රධාන ප්‍රඥප්තියේ 30 වන වගන්තිය ප්‍රතියෝජනය කරනු ලැබේ.

*7 වන වගන්තිය :* මෙම වගන්තිය මගින් ප්‍රධාන ප්‍රඥප්තියේ 104 වන මෙම වගන්තිය සංශෝධනය කරනු ලබන අතර, එය 8 වන වගන්තිය මගින් කරන ලද සංශෝධනයට ආනුෂංගික වේ.

*8 වන වගන්තිය :* මෙම වගන්තිය මගින් ප්‍රධාන ප්‍රඥප්තියට 104අ, 104ආ, 104ඇ, සහ 104ඈ වන අලුත් වගන්ති ඇතුළත් කරනු ලැබේ. මෙම අලුත් වගන්ති මගින්, අසත්‍ය තොරතුරු මත ලබාගන්නා දීමනා පත්‍රයක් අවලංගු කිරීමට ජනාධිපතිවරයාට හැකියාව ඇති කරවනු ලැබේ.

*9 වන වගන්තිය :* මෙම වගන්තිය මගින්, ඉඩම් කොටසක් බැහැර කිරීමේ දී හෝ උකස් කිරීමේ දී ඉඩම් කොටසේ අයිතිකරු විසින් අනුගමනය කළ යුතු ක්‍රියාපටිපාටිය සම්බන්ධයෙන් නියෝග සෑදීමට අමාත්‍යවරයාට හැකියාව ඇති කරවීම සඳහා ප්‍රධාන ප්‍රඥප්තියේ 156 වන වගන්තිය සංශෝධනය කරනු ලබන අතර, එය 4 වන වගන්තිය මගින් කරන ලද සංශෝධනයට ආනුෂංගික වේ.

*10 වන වගන්තිය :* මෙම වගන්තිය මගින්, ප්‍රධාන ප්‍රඥප්තියේ 51 වන සහ 72 වන වගන්තිවල කාර්යයන් සඳහා ඉඩම් කොටසක හෝ ඉඩමක හිමිකම සාරෝපණය වීම සම්බන්ධයෙන් අදාළ කාරණා සඳහා, විධිවිධාන සැලැස්වීම සඳහා, ප්‍රධාන ප්‍රඥප්තියේ තුන්වන උපලේඛනය සංශෝධනය කරනු ලැබේ.

එල්.ඩී.-ඕ. 25/2005

## (464 වන අධිකාරය වූ) ඉඩම් සංවර්ධන ආඥාපනත සංශෝධනය කිරීම සඳහා වූ පනතකි

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව විසින් මෙසේ පනවනු ලැබේ:-

කෙටි නාමය

1. මේ පනත 2022 අංක    දරන ඉඩම් සංවර්ධන (සංශෝධන) පනත යනුවෙන් හඳුන්වනු ලැබේ.

(464 වන අධිකාරය වූ) ඉඩම් සංවර්ධන ආඥාපනත සංශෝධනය කිරීම

2. (මෙහි මින්මතු "ප්‍රධාන ප්‍රඥප්තිය" යනුවෙන් සඳහන් කරනු ලබන) (464 වන අධිකාරය වූ) ඉඩම් සංවර්ධන ආඥාපනත, ප්‍රධාන ප්‍රඥප්තියේ හෝ වෙනත් යම් ලිඛිත නීතියක, දැන්වීමක, නිවේදනයක, කොන්ත්‍රාත්තුවක, දැනුම්දීමක හෝ වෙනත් ලේඛනයක "ඉඩම් කොමසාරිස්" යන වචන යෙදෙන කවර හෝ තැනක දී ඒ වෙනුවට "ඉඩම් කොමසාරිස් ජනරාල්" යන වචන ආදේශ කිරීමෙන්, මෙයින් සංශෝධනය කරනු ලැබේ.

ප්‍රධාන ප්‍රඥප්තියේ 5 වන වගන්තිය ප්‍රතියෝජනය කිරීම

3. ප්‍රධාන ප්‍රඥප්තියේ 5 වන වගන්තිය මෙයින් ඉවත් කරනු ලබන අතර, ඒ වෙනුවට පහත දැක්වෙන වගන්තිය ආදේශ කරනු ලැබේ:-

"අතිරේක ඉඩම් කොමසාරිස්වරයන් හා වෙනත් නිලධරයන් පත්කිරීම

5. මේ ආඥාපනතේ කාර්ය සඳහා කලින් කලට අවශ්‍ය විය හැකි පරිදි, අතිරේක ඉඩම් කොමසාරිස්වරයන්, නියෝජ්‍ය ඉඩම් කොමසාරිස්වරයන්, සහකාර ඉඩම් කොමසාරිස්වරයන් සහ එවැනි වෙනත් නිලධරයන්, එක් තැනැත්තකු හෝ ඊට වැඩි තැනැත්තන් සංඛ්‍යාවක් පත් කරනු ලැබිය හැකි ය.".

ප්‍රධාන ප්‍රඥප්තියේ 19 වන වගන්තිය සංශෝධනය කිරීම

4. ප්‍රධාන ප්‍රඥප්තියේ 19 වන වගන්තියේ (6) වන උපවගන්තියට ඉක්බිතිව ම, පහත දැක්වෙන අලුත් උපවගන්තිය එකතු කිරීමෙන් ඒ වගන්තිය සංශෝධනය කරනු ලැබේ:-

"(7) (6) වන උපවගන්තියේ (ආ) ඡේදයේ විධිවිධානවල කුමක් සඳහන්ව තිබුණ ද, ඒ ඉඩම් කොටස බලපත්‍රලාභී වාණිජ බැංකුවක්, රාජ්‍ය උකස් හා ආයෝජන බැංකුව, ලංකා සංවර්ධන මුදල් සංස්ථාව, ශ්‍රී ලංකා ජාතික සංවර්ධන බැංකුව,

ජාතික නිවාස සංවර්ධන අධිකාරිය, ශ්‍රී ලංකා නිවාස සංවර්ධන මූල්‍ය සංස්ථා බැංකුව, ලියාපදිංචි කරනු ලැබූ යම් සංගමයක් හෝ වෙනත් නියමිත ආයතනයක් වෙත උකස් කිරීමේ දී ප්‍රාදේශීය ලේකම්වරයාගේ අනුමතය අවශ්‍ය නොවන්නේ ය.”.

ප්‍රධාන ප්‍රඥප්තියට 28 වන වගන්තිය ඇතුළත් කිරීම

**5.** ප්‍රධාන ප්‍රඥප්තියේ 27 වන වගන්තියට ඉක්බිතිව ම, පහත දැක්වෙන අලුත් වගන්තිය මෙයින් ඇතුළත් කරනු ලබන අතර, එය ඒ ප්‍රඥප්තියේ 28 වන වගන්තිය ලෙස බලපැවැත්විය යුතු ය:-

“මනිනු නොලැබූ ඉඩම් සඳහා ප්‍රදාන පත්‍ර නිකුත් නොකරන බව

28. මිනුම්පති විසින් මනිනු නොලැබූ රජයේ ඉඩමක්, ප්‍රදාන පත්‍රයක් මගින්, අන්සතු කරනු නොලැබිය යුතු ය.”.

ප්‍රධාන ප්‍රඥප්තියේ 30 වන වගන්තිය ප්‍රතියෝජනය කිරීම

**6.** ප්‍රධාන ප්‍රඥප්තියේ 30 වන වගන්තිය මෙයින් ඉවත් කරනු ලබන අතර, ඒ වෙනුවට පහත දැක්වෙන වගන්තිය ආදේශ කරනු ලැබේ :-

“රේඛා සටහනක් ප්‍රදාන පත්‍රයකට ඇමිණිය යුතු බව

30. කිසියම් දීමනා පත්‍රයක් පිට අන්සතු කරන ලද ඉඩමක් මිනුම්පති විසින් ඔහුගේ හෝ විධානය පිට සම්පාදනය කරනු ලදුව ඔහු භාරයේ තිබෙන රේඛා සටහනක් ආශ්‍රයෙන් විස්තර කළ යුතු ය. මිනුම්පති විසින් හෝ ඔහුගේ විධානය පිට සම්පාදනය කරන ලද රේඛා සටහනක් ඒ ඒ දීමනා පත්‍රයට ඇමිණිය යුතු ය.”.

ප්‍රධාන ප්‍රඥප්තියේ 104 වන වගන්තිය ප්‍රතියෝජනය කිරීම

**7.** ප්‍රධාන ප්‍රඥප්තියේ 104 වන වගන්තිය මෙයින් ඉවත් කරනු ලබන අතර, ඒ වෙනුවට පහත දැක්වෙන වගන්තිය ආදේශ කරනු ලැබේ:-

“ජනාධිපතිවරයා විසින් ප්‍රදාන පත්‍රය අවලංගු කරනු ලැබිය හැකි බව

104.(අ) අනුප්‍රාප්තියකු වීම සඳහා නීත්‍යනුකූලව හිමිකම් ලබන තැනැත්තකු නොමැති වීමෙන් හෝ හිමිකම් ලබන තැනැත්තකු සිටිය ද, ඔහු අනුප්‍රාප්තිකයකු වීමට අකමැති වීමෙන් කිසියම් ඉඩම් කොටසක අනුප්‍රාප්තිකභාවයට කෙනෙකු පත්වීමට අසමත් වී ඇති බවට; හෝ

(ආ) ප්‍රදාන පත්‍රය අසත්‍ය තොරතුරු මත වංචනික ලෙස ලබාගෙන ඇති බවට හෝ ප්‍රදාන පත්‍රය නීත්‍යනුකූල පදිංචිකරු හැර වෙනත් තැනැත්තකු වෙත නිකුත් කර ඇති බවට,

ජනාධිපතිවරයා විසින් සෑහීමකට පත්වන අවස්ථාවක, ජනාධිපතිවරයා විසින් එකී ඉඩම් කොටසෙහි ප්‍රදාන පත්‍රය අවලංගු කරමින් නියමයක් කරනු ලැබිය හැකි ය.”.

**ප්‍රධාන ප්‍රඥප්තියට 104අ, 104ආ, 104ඇ සහ 104ඈ වන වගන්ති ඇතුළත් කිරීම**

8. ප්‍රධාන ප්‍රඥප්තියේ 104 වන වගන්තියට ඉක්බිතිව ම පහත දැක්වෙන අලුත් වගන්ති මෙයින් ඇතුළත් කරනු ලබන අතර, ඒවා 104අ, 104ආ, 104ඇ සහ 104ඈ වන වගන්ති ලෙස බලපැවැත්විය යුතු ය:-

**“අසත්‍ය තොරතුරු මත ප්‍රදාන පත්‍රය ලබාගත් ඉඩම් කොටසෙහි අයිතිකරු වෙත නිකුත් කළ යුතු දැන්වීම**

104අ. (1) අවස්ථාවෝචිත පරිදි, ඉඩම් කොමසාරිස් ජනරාල්වරයා සතුව පැවතිය හැකි තොරතුරු මත හෝ මේ පනතේ විධිවිධාන යටතේ ඉඩම් කොටසේ හිමිකාරත්වයට සම්බන්ධතාවක් දක්වන තැනැත්තකුගෙන් ලද තොරතුරු මත, ප්‍රදාන පත්‍රයක් ලබාගැනීම සඳහා ඉඩම් කොටසේ අයිතිකරු විසින් හිතාමතා ම අසත්‍ය තොරතුරු ලබා දී ඇති බව හෝ ප්‍රදාන පත්‍රය, නීත්‍යානුකූල පදිංචිකරු හැර වෙනත් තැනැත්තකු වෙත නිකුත් කර ඇති බව ඉඩම් කොමසාරිස් ජනරාල්වරයා වෙත පෙනී යන්නේ නම්, ඉඩම් කොමසාරිස් ජනරාල්වරයා විසින්, ඉඩම් කොටසේ අයිතිකරු වෙත හෝ එහි පදිංචිකරු වෙත නියමිත ආකෘතියෙන් දැන්වීමක් නිකුත් කරනු ලැබිය යුතු ය.

(2) අයිතිකරු විසින් එකී දැන්වීමෙහි නිශ්චිතව දක්වා ඇති දිනයේ දී, සහ වේලාවේ දී සහ ස්ථානයේ දී ප්‍රදාන පත්‍රය අවලංගු නොකිරීම සඳහා ප්‍රමාණවත් කරුණු ඉඩම් කොමසාරිස් ජනරාල්වරයා වෙත දක්වන්නේ නම් මිස, දක්වා ඇති කරුණු මත එම ඉඩම් කොටස සම්බන්ධයෙන් නිකුත් කරන ලද ප්‍රදාන පත්‍රය අවලංගු කළ හැකි බව, එකී දැන්වීමෙහි නිශ්චිතව දැක්විය යුතු ය.

(3) ඉඩම් කොමසාරිස් ජනරාල්වරයා විසින්, ඔහු සතුව පැවතිය හැකි තොරතුරු මත, මේ පනතේ විධිවිධාන යටතේ ඉඩම් කොටසෙහි හිමිකමට සම්බන්ධතාවක් දක්වන තැනැත්තකු වෙත ද, එම දැන්වීමෙහි පිටපතක් භාරදීමට සැලැස්විය හැකි ය.

කරුණු ගෙනහැර දැක්වීම සඳහා ලබාදෙන කාලසීමාව

104ආ. 104අ වන වගන්තිය යටතේ නිකුත් කරන ලද දැන්වීමෙහි නිශ්චිතව දක්වා ඇති දිනය, අයිතිකරු වෙත එම දැන්වීම නිකුත් කරන ලද දින සිට දින තිහකට වඩා අඩු නොවිය යුතු ය.

දැන්වීම ඉඩමේ ප්‍රදර්ශනය කර, ඉඩමට සම්බන්ධතා ඇති අයට භාර දිය යුතු බව

104ඇ. (1) දැන්වීම, ඉඩම් කොටසෙහි අයිතිකරු වෙත ලියාපදිංචි තැපෑලෙන් භාර දිය යුතු අතර, දැන්වීමෙහි පිටපතක් ඉඩම් කොටසෙහි පැහැදිළිව පෙනෙන ස්ථානයක ඇලවිය යුතු ය.

(2) (අ) (1) වන උපවගන්තිය යටතේ දැන්වීමක් භාරදිය යුත්තේ යම් අයිතිකරුවකු වෙත ද, නිසි උද්යෝගයෙන් ක්‍රියා කරනු ලැබුව ද එම අයිතිකරු සොයා ගත නොහැකි අවස්ථාවක, එම දැන්වීමෙහි පිටපතක් අයිතිකරුගේ පවුලේ සාමාජිකයකු වෙත හෝ අයිතිකරු සමඟ ජීවත් වන තැනැත්තකු වෙත භාරදෙනු ලැබුවේ නම්, දැන්වීම නිසි පරිදි භාරදුන් බවට සලකනු ලැබිය යුතු ය; හෝ

(ආ) එසේ දැන්වීම භාරදෙනු ලැබිය හැකි සාමාජිකයකු එම අයිතිකරුගේ පවුලේ නොමැති අවස්ථාවක, එම දැන්වීමෙහි පිටපතක් අයිතිකරු සාමාන්‍යයෙන් ජීවත්වන ගෙදර හෝ නිවසෙහි පැහැදිළිව පෙනෙන ස්ථානයක අලවා ඇතිනම්, දැන්වීම එම අයිතිකරු වෙත නිසි පරිදි භාර දුන් බවට සලකනු ලැබිය යුතු ය.

ප්‍රදාන පත්‍රය අවලංගු කිරීම

104ඈ. (1) දැන්වීමක් තැනැත්තකු වෙත භාරදෙනු ලැබුවේ ද, එම තැනැත්තා විසින්, දැන්වීමෙහි නිශ්චිතව දක්වා ඇති දිනයේ දී, සහ වේලාවේ දී සහ ස්ථානයේ දී පෙනී සිටීමට අපොහොසත් වන අවස්ථාවක හෝ ඔහු පෙනී සිට ප්‍රදාන පත්‍රය අවලංගු නොකිරීමට දැක්විය හැකි හේතු තමා සතු නොවන

බව සඳහන් කරන අවස්ථාවක, එම දැන්වීම නිසි පරිදි භාර දී ඇති බවට සහ ප්‍රදාන පත්‍රය වංචනික ලෙස ලබාගෙන ඇති බවට ඉඩම් කොමසාරිස් ජනරාල්වරයා විසින් සෑහීමකට පත්වන්නේ නම්, ඉඩම් කොමසාරිස් ජනරාල්වරයා විසින් එම ප්‍රදාන පත්‍රය අවලංගු කිරීම සම්බන්ධයෙන් වන නිර්දේශ, එකී නිර්දේශ සඳහා වන හේතු සමඟ ඉඩම් විෂයය පවරනු ලැබ ඇති අමාත්‍යවරයා වෙත ඉදිරිපත් කළ යුතු ය.

(2) අමාත්‍යවරයා විසින්, අවශ්‍ය අවස්ථාවල එම නිර්දේශ සම්බන්ධයෙන් වැඩිදුර පැහැදිළි කිරීම් ඉඩම් කොමසාරිස් ජනරාල්වරයාගෙන් ඉල්ලා සිටිය හැකි ය.

(3) ප්‍රදාන පත්‍රය අවලංගු කිරීමට හේතු පවතින බවට අමාත්‍යවරයා විසින් සෑහීමකට පත්වන අවස්ථාවක, අමාත්‍යවරයා විසින්, ඉඩම් කොමසාරිස් ජනරාල්වරයා විසින් ඉදිරිපත් කරන ලද නිර්දේශ ජනාධිපතිවරයා වෙත ඉදිරිපත් කළ යුතු ය.

(4) ඉඩම් කොමසාරිස් ජනරාල්වරයාගේ නිර්දේශ සලකා බැලීමෙන් පසු, ජනාධිපතිවරයා විසින් ප්‍රදානය අවලංගු කිරීමට හෝ අවලංගු නොකිරීමට නියම කරනු ලැබිය හැකි ය.

(5) ජනාධිපතිවරයාගේ නියෝගය ලැබීමෙන් පසු, ඉඩම් කොමසාරිස් ජනරාල්වරයා විසින් 104ඇ වගන්තියෙහි සඳහන් අදාළ තැනැත්තන් වෙත එම නියමය පිළිබඳ දැනුම් දිය යුතු අතර, ජනාධිපතිවරයාගේ නියමයට අනුකූල වීම සඳහා අවශ්‍ය පියවර ගනු ලැබිය යුතු ය.".

ප්‍රධාන ප්‍රඥප්තියේ 156 වන වගන්තිය සංශෝධනය කිරීම

**9.** ප්‍රධාන ප්‍රඥප්තියේ 156 වන වගන්තිය, එහි (ඌ) ඡේදයට ඉක්බිතිව ම, පහත දැක්වෙන අලුත් ඡේදය ඇතුළත් කිරීමෙන් මෙයින් සංශෝධනය කරනු ලැබේ:-

"(ඌඅ) මේ පනත යටතේ යම් ඉඩම් කොටසක් බැහැර කිරීමේ දී හෝ උකස් කිරීමේ දී ඉඩම් කොටසේ අයිතිකරු විසින් අනුගමනය කළ යුතු කාර්ය පටිපාටිය;".

**10.** ප්‍රධාන ප්‍රඥප්තියේ තුන්වන උපලේඛනය මෙයින් ඉවත් කරනු ලබන අතර, ඒ වෙනුවට පහත දැක්වෙන උපලේඛනය ආදේශ කරනු ලැබේ:- ප්‍රධාන ප්‍රඥප්තියේ තුන්වන උපලේඛනය ප්‍රතියෝජනය කිරීම

"තුන්වන උපලේඛනය

(51 වන සහ 72 වන වගන්ති)

රීති

1. (අ) 51 වන වගන්තියේ කාර්යය සඳහා අනුප්‍රාප්තිකයකු නම් කිරීම මීට අනුබද්ධිත වගුවේ දැක්වා ඇති පරිදි ඥාති බාණ්ඩ අතරින් කළ හැකි වන්නේ ය.

(ආ) 72 වන වගන්තියේ කාර්යය සඳහා, ඉඩම් කොටසක හෝ ඉඩමක හිමිකම, සාරෝපණය විය යුත්තේ එහි අවසරපත්‍රකරුගේ හෝ හිමිකරුගේ ඥාති බාණ්ඩ අතරින් මෙහි අනුබද්ධිත වගුවේ පිළිවෙළින් දැක්වෙන ප්‍රමුඛතා අනුපිළිවෙල අනුව ඥාතියකු වෙතය. මෙහි එක් බාණ්ඩයක ඥාතීන් එක් අයකුට වඩා සිටින අවස්ථාවක වයසින් වැඩිමහළු තැනැත්තා බාල තැනැත්තාට වඩා ප්‍රමුඛත්වයක් ලැබිය යුතු ය.

(ඇ) අනුබද්ධිත වගුවේ දැක්වෙන කිසියම් ඥාති බාණ්ඩයක එකම වයසේ දෙදෙනකු හෝ ඊට වැඩි ගණනක් සිටින විට සහ ඉඩම් කොටසෙහි හෝ ඉඩමෙහි අනුප්‍රාප්තිය සඳහා ඔවුනට සමාන හිමිකම් ඇති විට හා අනුප්‍රාප්තික වීමට කැමැත්ත දක්වන විට, ඉඩම් කොටසෙහි හෝ ඉඩමෙහි හිමිකම, ඉඩම පිහිටා ඇති අදාළ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ ප්‍රාදේශීය ලේකම්වරයා විසින් නිශ්චය කරනු ලැබිය හැකි තැනැත්තන් වෙත සාරෝපණය විය යුතු ය.

(ඈ) ඉහත (ආ) සහ (ඇ) ඡේදයන්හි විධිවිධානවල කුමක් සඳහන්ව තිබුණ ද-

(i) අනුබද්ධිත වගුවේ පිළිවෙළින් සඳහන් කර ඇති ප්‍රමුඛතා අනුපිළිවෙළෙහි ඇතුළත් යම් තැනැත්තකු විසින් එම ඉඩම සංවර්ධනය කර ඇති අවස්ථාවක, ඉඩම් කොටසෙහි හෝ ඉඩමෙහි හිමිකම, (ආ) ඡේදයේ සඳහන් වැඩිමහළු තැනැත්තා වෙත නොව එම ඉඩම සංවර්ධනය කළ තැනැත්තා වෙත සාරෝපණය විය යුතු ය; හෝ

(ii) අනුබද්ධිත වගුවේ පිළිවෙළින් සඳහන් කර ඇති ප්‍රමුඛතා අනුපිළිවෙළෙහි ඇතුළත් තැනැත්තන් දෙදෙනකු හෝ ඊට වැඩි පිරිසක් විසින් ඉඩම සංවර්ධනය කර ඇති අවස්ථාවක, ඉඩම් කොටසෙහි හෝ ඉඩමෙහි හිමිකම, එම ඉඩම සංවර්ධනය කළ තැනැත්තන් වෙත සාරෝපණය විය යුතු ය.

2. මේ රීතිවල විධිවිධාන යටතේ යම් ඉඩම් කොටසක හෝ ඉඩමක අයිතිය සාරෝපණය වන තැනැත්තා අනුප්‍රාප්තිය ලබා ගැනීමට අකමැති වේ නම්, 1 වන රීතියෙහි විධිවිධානවලට යටත්ව, අනුප්‍රාප්ත වීමට ඊළඟට හිමිකම් ඇති ඥාතියා වෙත අයිතිය සාරෝපණය විය යුතු ය.

3. ප්‍රාදේශීය ලේකම්වරයා විසින්, ඔහු ඉදිරියේ ඇති වැදගත් කරුණු පිළිබඳ සෑහීමකට පත්වීමෙන් පසුව සහ ඔහු විසින් නිශ්චිතව දක්වා ඇති හේතු මත, අදාළ පළාත් පාලන ආයතනය විසින් නිශ්චිතව දක්වා ඇති අනුවිභජන ඒකකයට හෝ අවම භාගයට අදාළ අතුරු නීති, රීති සහ නියෝග, සහ 2000 අංක 46 දරන ගොවිජන සංවර්ධන පනතේ සහ (453 වන අධිකාරය වූ) වාරිමාර්ග ආඥාපනතෙහි විධිවිධානවලට අනුව, 1 වන රීතියේ සඳහන් එකී තැනැත්තා හෝ තැනැත්තන් නිශ්චය කරනු ලැබිය යුතු ය.

වගුව

| | |
|---|---|
| (i) ළමයින් | (iv) සහෝදර සහෝදරියන් |
| (ii) මුණුබුරු මිණිබිරියන් | (v) මාමාවරුන් සහ නැන්දණියන් |
| (iii) දෙමව්පියන් | (vi) ලේලියන් සහ බෑණාවරුන් |

මේ රීතියේ -

"ළමයා" යන්නට, නීතියට අනුව දරුකමට හදා ගනු ලබන ළමයකු ඇතුළත් වේ; සහ

"ඥාතියා" යන්නට, ලේ ඥාතියකු හෝ නීතියට අනුව දරුකමට හදාගත් ඥාතියකු අදහස් වන අතර ඊට විවාහයකින් ඇතිවන ඥාතිකමක් ඇතුළත් නොවන්නේ ය.".

11. මේ පනතේ සිංහල හා දෙමළ භාෂා පාඨ අතර යම් අනනුකූලතාවක් ඇතිවුවහොත්, එවිට, සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු ය.

අනනුකූලතාවක් ඇති වූ විට සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු බව